# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2022 නොවැම්බර් මස 04 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2022.11.04 දින නිකුත් කරන ලදී)**


## බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ

**බදු ගිවිසුමක් යටතේ බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමට අදාළ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද; හිඟ බදු වාරික මුදල්, සේවා ගාස්තු සහ ප්‍රමාණ කළ අලාභ අයකර ගැනීම විධිමත් කිරීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 55.00 | තැපැල් ගාස්තුව : රු. 35.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ

එල්.ඩී.-ඕ. 66/2021

**බදු ගිවිසුමක් යටතේ බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමට අදාළ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද; හිඟ බදු වාරික මුදල්, සේවා ගාස්තු සහ ප්‍රමාණ කළ අලාභ අයකර ගැනීම විධිමත් කිරීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක   දරන බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### නඩු පැවරීම

බද්දට දී ඇති පරිශ්‍රයක සන්තකය ආපසු ලබා ගැනීම සඳහා බදු දීමනාකරු විසින් නඩු පැවරීම

**2.** (1) බදු දීමනාකරුවකු විසින් යම් පරිශ්‍රයක් බද්දට දී ඇති අවස්ථාවක දී, ඒ බදු දීමනාකරු විසින්, එම පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව-

(අ) බද්දට දී ඇති පරිශ්‍රය පිහිටා ඇත්තා වූ ද;

(ආ) බදු ගැනුම්කරු පදිංචිව සිටින්නා වූ ද;

(ඇ) නඩු නිමිත්ත උද්ගත ව ඇත්තා වූ ද; හෝ

(ඈ) බලාත්මක කිරීමට අපේක්ෂිත බදු ගිවිසුම සාදනු ලැබුවා වූ ද,

අධිකරණ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සීමාව ඇතුළත පිහිටි අධිකරණයේ නඩුවක් පවරනු ලැබිය හැකි ය.

(2) යම් පරිශ්‍රයක සන්තකය බදු ගිවිසුමක් මගින් බදු ගැනුම්කරුට බද්දට දී ඇත්නම් මිස, ඒ බද්දට දී ඇති පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හෝ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් සහනයක් ලබා ගැනීම සඳහා මේ පනතේ විධිවිධාන යටතේ බදු දීමනාකරුවකු විසින් නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

නඩු පැවරීම සඳහා හේතු

**3.** බදු ගැනුම්කරු -

(අ) බදු ගිවිසුමෙහි කාලසීමාව කල්පිරීමේ දී; හෝ

(ආ) බදු ගිවිසුමේ සඳහන් කවර හෝ නියම, කොන්දේසි, ප්‍රතිඥා, බැඳීම් හෝ යුතුකම් බදු ගැනුම්කරු විසින් උල්ලංඝනය කිරීම හේතුවෙන් බදු ගිවිසුමේ කාලසීමාව අවසන්වීමට පෙරාතුව බදු දීමනාකරු විසින් බදු ගිවිසුම අවසන් කිරීමේ නිවේදනයක් නිකුත් කොට බදු ගිවිසුම අවසන් කිරීමේ දී,

බද්දට දී ඇති පරිශ්‍රය හැරයාම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම් හෝ අතපසු කරන්නේ නම් හෝ බද්දට දී ඇති පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා බදු දීමනාකරු විසින් මේ පනත යටතේ නඩුවක් පවරනු ලැබිය හැකි ය.

ගොනු කරනු ලැබිය යුතු ලේඛන

**4.** (1) සිවිල් නඩු විධාන සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියේ වූ පැමිණිල්ලක් (මෙහි මින් මතු "පැමිණිලිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) බදු දීමනාකරු විසින් ඉදිරිපත් කිරීම මගින් නඩුවක් ගොනු කරනු ලැබිය යුතු අතර, එම පැමිණිල්ල සමඟ-

(අ) (මෙහි මින් මතු "විත්තිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) බදු ගැනුම්කරුගෙන් (මෙහි මින් මතු "පරිශ්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ නඩුවේ විෂය වස්තුව වන බද්දට දී ඇති පරිශ්‍රයේ සන්තකය පැමිණිලිකරුට නීත්‍යානුකූලව හිමිවිය යුතු බවට වූ දිවුරුම් පත්‍රයක්;

(ආ) නයිසයි තීන්දු ප්‍රකාශය සඳහා සහ එය භාරදීම සඳහා නීතිය මගින් නියම කර ඇති අදාළ මුද්දර සමඟ නයිසයි තීන්දු ප්‍රකාශයේ කෙටුම්පතක්; සහ

(ඇ) නඩුවේ එක් විත්තිකරුවකුට වඩා වැඩි විත්තිකරුවන් සංඛ්‍යාවක් සිටී නම්, එම විත්තිකරුවන් සංඛ්‍යාවට සමානව පැමිණිල්ලේ, දිවුරුම් පත්‍රයේ හා බදු ගිවිසුමේ පිටපතක් බැගින් සහ බදු දීමනාකරු විසින් විශ්වාසය තබන යම් ලේඛනයක් ද ඒ සමඟ,

අධිකරණයේ ගොනු කරනු ලැබිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ පැමිණිලිකරු විසින් ගොනු කළ යුතු දිවුරුම් පත්‍රය පැමිණිලිකරු විසින් ම හෝ පැමිණිලිකරු වෙනුවෙන් එවැනි දිවුරුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට නීතියෙන් යථා පරිදි බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් ගොනු කරනු ලැබිය යුතු ය.

(ආ) 3 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් හේතුව මත පැමිණිලිකරු විසින් නඩුව ගොනු කරනු ලැබ ඇත්නම්, පැමිණිලිකරු විසින් එම කරුණු අයැදිය යුතු අතර, විත්තිකරු විසින් කරන ලද උල්ලංඝනය කිරීම බැලූ බැල්මට තහවුරු කොට ගිවිසුම කලින් අවසන් කිරීම පිළිබඳ සාක්ෂි ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පවරන ලද යම් නඩුවක දී, නයිසයි තීන්දු ප්‍රකාශය නිකුත් කිරීම සඳහා නඩුව පැවරීමේ දී නඩුව පැවරීමෙන් දින හතක් ඇතුළත එම නඩුව තහවුරු කිරීම සඳහා අධිකරණය විසින් පැමිණිලිකරුට අවසර ලබා දිය යුතු ය.

අධිකරණය විසින් නයිසයි තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීම

**5.** (1) 4 වන වගන්තිය ප්‍රකාරව නයිසයි තීන්දු ප්‍රකාශය නිකුත් කිරීම සඳහා අධිකරණයෙහි නඩුව තහවුරු කරනු ලබන අවස්ථාවක දී-

(අ) ඉදිරිපත් කර ඇති බදු ගිවිසුම-

(i) නිසි ලෙස ලියා අත්සන් කර ඇති බවට සහ නීතිය මගින් නියම කර ඇති ආකාරයට එයට යථා පරිදි මුද්දර අලවා ඇති බවට ද;

(ii) ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් කරන ප්‍රකාශයෙහි සඳහන් පරිදි එහි යම් වෙනස් කිරීමක්, මකා දැමීමක් හෝ අන්තර් නිවේශනයක්, ගිවිසුම ලියා අත්සන් කරන පාර්ශ්වකරුවන් විසින් එය අත්සන් කිරීමට

පෙර සිදුකර ඇත්නම් මිස, අවස්ථාවෝචිත පරිදි, යම් වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් හෝ අන්තර් නිවේශනයක් හේතුවෙන් එය සැකයට භාජනය නොවන බවට ද; සහ

(ආ) ගොනුකර ඇති දිවුරුම් පත්‍රයේ අන්තර්ගත කරුණු පැමිණිලිකරුගේ පාර්ශ්වයෙන් වූ නඩුව බැලූ බැල්මට පෙනෙන පරිදි ඔප්පු කිරීමට ප්‍රමාණවත් බවට ද,

අධිකරණයට පෙනී යයි නම්, අධිකරණය විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කවර හෝ සහනයක් ද සමඟ පැමිණිල්ලේ විස්තර කර ඇති පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා, පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියේ වූ නයිසයි තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සහන පහත දැක්වෙන පරිදි විය යුතු යඃ-

(අ) හිඟ බදු වාරික මුදල්;

(ආ) පැමිණිලිකරුට පරිශ්‍රයේ නිරවුල් සන්තකය ආපසු ලබාදෙන තෙක් සේවා ගාස්තු ඇත්නම්, එම ගාස්තු;

(ඇ) බදු ගිවිසුම කල් පිරීමේ දිනයේ සිට හෝ බදු ගිවිසුම අවසන් කිරීම බලාත්මක වන දිනයේ සිට, පැමිණිලිකරුට පරිශ්‍රයේ නිරවුල් සන්තකය ආපසු ලබාදෙන දිනය තෙක් ප්‍රමාණ කළ අලාභ ඇත්නම්, එම අලාභ;

(ඈ) නීත්‍යානුකූල පොලී අනුපාතිකය අනුව හිඟ බදු වාරික මුදල්, සේවා ගාස්තු සහ ප්‍රමාණ කළ අලාභ මත පොලිය; හෝ

(ඉ) සුදුසු යයි අධිකරණයට පෙනීයන්නා වූ පැමිණිලිකරු විසින් අයැද ඇති වෙනත් සහන ද සමඟ අධිකරණය විසින් අවසර දිය හැකි යම් ගාස්තු.

ප්‍රමාණ කළ අලාභ

**6.** (1) පාර්ශ්වකරුවන් විසින් බදු ගිවිසුමෙහි එකඟ වී ඇති බදු වාරික මුදල මෙන් දෙගුණයක් ඉක්මවන ප්‍රමාණ කළ අලාභ බදු ගිවිසුමෙන් එකඟ වී තිබුණ ද, 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබිය යුතු ප්‍රමාණ කළ අලාභ තීරණය කිරීමේ දී අධිකරණය විසින්, බදු ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින්

බදු ගිවිසුමෙහි එකඟ වී ඇති බදු වාරික මුදල මෙන් දෙගුණයක් ඉක්මවන මුදලක් ප්‍රදානය නොකළ යුතු ය.

(2) 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නඩු පැවරීමේ හේතු සම්බන්ධයෙන් ගෙවිය යුතු ප්‍රමාණ කළ අලාභ සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විසින් බදු ගිවිසුමෙහි එකඟ වී නොමැති අවස්ථාවක දී, ප්‍රදානය කරනු ලැබිය හැකි ප්‍රමාණ කළ අලාභ මුදල, පාර්ශ්වකරුවන් විසින් බදු ගිවිසුමෙහි එකඟ වී ඇති බදු වාරික මුදල විය යුතු ය.

සේවා ගාස්තු ගෙවීම

**7.** විත්තිකරු විසින්, සෘජුව ම පැමිණිලිකරු වෙත හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් තැනැත්තකු වෙත සේවා ගාස්තුවක් ගෙවීම සඳහා බදු ගිවිසුමෙහි එකඟ වී ඇත්නම් මිස, සේවා ගාස්තුවක් ගෙවීම සඳහා නියෝග කරනු නොලැබිය යුතු ය.

II වන කොටස

**නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීම**

නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීම, සාමාන්‍යයෙන් ලියාපදිංචි තැපෑලෙන් කළ යුතු බව

**8.** (1) පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින පරිදි පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා විත්තිකරු වෙත නයිසයි තීන්දු ප්‍රකාශයක් භාරදීමේ දී පෙනී සිටීමට සහ ස්වකීය ස්ථාවරය පිළිබඳ හේතු දැක්වීමට ඉල්ලීමක් කිරීම සඳහා විත්තිකරුවකු වෙත සාධාරණ අවස්ථාවක් ලබා දෙනු ලැබිය යුතු ය.

(2) නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත සාමාන්‍යයෙන් ලියාපදිංචි තැපෑලෙන් පරිශ්‍රයට හෝ දැන්වීම් භාර දීම සඳහා විත්තිකරු විසින් බදු ගිවිසුමෙහි ලිපිනයක් දී ඇත්නම්, එම ලිපිනයට භාරදෙනු ලැබිය යුතු ය.

(3) 5 වන වගන්තිය යටතේ නයිසයි තීන්දු ප්‍රකාශය ඇතුළත් කිරීමේ දිනයේ සිට දින තුනකට වඩා පසු නොවන කාලසීමාවක් ඇතුළත අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, විත්තිකරු වෙත නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීම සඳහා කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.

අධිකරණ නියෝග භාරදෙන නිලධරයකු මගින් නයිසයි තීන්දු ප්‍රකාශය භාර දීම

**9.** (1) අධිකරණය විසින්, 5 වන වගන්තිය යටතේ නයිසයි තීන්දු ප්‍රකාශයකට එළඹීමෙන් ඉක්බිතිව ම, තත්කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත සහ අධිකරණයේ අභිමතය පරිදි, ලියාපදිංචි තැපෑලෙන් නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීමට අමතරව, අධිකරණ නියෝග භාරදෙන නිලධරයකු මගින් විත්තිකරු වෙත පෞද්ගලිකව ම දෙනු

ලැබීමෙන් හෝ ගෙන ගොස් භාරදීමෙන් ද නයිසයි තීන්දු ප්‍රකාශය භාරදෙනු ලැබිය හැකි බවට ආඥා කරනු ලැබිය හැකි ය.

(2) ඒ නයිසයි තීන්දු ප්‍රකාශය (1) වන උපවගන්තිය යටතේ අධිකරණ නියෝග භාරදෙන නිලධරයකු මගින් භාරදීමට ආඥා කරන ලද අවස්ථාවක දී, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් වූ අණපත්‍රය ද සමඟ නයිසයි තීන්දු ප්‍රකාශය අධිකරණ නියෝග භාරදෙන නිලධරයා විසින් ලබාගත් දින සිට දින දහයක් ඇතුළත එම නිලධරයා විසින් එම නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත භාරදීම සඳහා අධිකරණ නියෝග භාරදෙන නිලධරයා වෙත බලය පවරනු ලැබිය යුතු ය.

(3) නයිසයි තීන්දු ප්‍රකාශය, ශ්‍රී ලංකාවේ කවර වූ කොටසක දී භාරදෙනු ලැබිය හැකි ය. අධිකරණ නියෝග භාරදෙන නිලධරයකු මගින් පෞද්ගලිකව ම භාරදිය යුතු යයි ආඥා කරනු ලැබූ නයිසයි තීන්දු ප්‍රකාශයක් එම නයිසයි තීන්දු ප්‍රකාශය නිකුත් කරනු ලබන අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සීමාවෙන් බැහැරව භාරදීමට නියමිතව ඇති අවස්ථාවක දී, ඒ නයිසයි තීන්දු ප්‍රකාශය ඒ අධිකරණය විසින් වහාම විත්තිකරු වාසය කරන බවට විශ්වාස කරනු ලබන අධිකරණ බල සීමාව ඇතුළත වූ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධානවලට අනුකූලව නයිසයි තීන්දු ප්‍රකාශය යථා පරිදි විත්තිකරු වෙත භාරදීම සඳහා කටයුතු සැලැස්වීම, අවසන්වරට සඳහන් කරන ලද අධිකරණයේ කාර්යය විය යුතු ය.

(4) නයිසයි තීන්දු ප්‍රකාශයක්, එම නයිසයි තීන්දු ප්‍රකාශය නිකුත් කරනු ලබන අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සීමාවෙන් බැහැරව භාරදීමට නියමිතව ඇති අවස්ථාවක දී, අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි හෝ පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක් මත, වාර්තා කරනු ලැබිය යුතු හේතු අනුව සහ ගාස්තු පිළිබඳ යම් කොන්දේසි මත, ඒ අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සීමාවෙන් බැහැරව ඒ නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීමට සහ විශේෂ අධිකරණ නියෝග භාරදෙන තැනැත්තකු ලෙස කටයුතු කිරීමට එම අධිකරණයේ අධිකරණ නියෝග භාරදෙන නිලධරයා වෙත බලය පවරනු ලැබිය හැකි ය.

(5) නයිසයි තීන්දු ප්‍රකාශය භාරදුන් බවට පිළිගැනීමක් වශයෙන් නයිසයි තීන්දු ප්‍රකාශයේ මුල් පිටපතේ විත්තිකරුගේ හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුගේ අත්සන හෝ මාපට ඇඟිලි සටහන හෝ ඒ දෙකම ලබා ගැනීමට උත්සාහ දැරීම අධිකරණ

නියෝග භාරදෙන නිලධරයාගේ කාර්යය විය යුතු ය. (2) වන උපවගන්තියේ සඳහන් දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිය පරිදි නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීමේ ක්‍රමය අධිකරණය වෙත දැනුම් දෙන වාර්තාවක් ද සමග අණපත්‍රය, අධිකරණ නියෝග භාරදෙන නිලධරයා විසින් අධිකරණය වෙත ආපසු භාරදෙනු ලැබිය යුතු ය.

(6) නිසි උද්‍යෝගය ක්‍රියාත්මක කිරීමෙන් (1) වන උපවගන්තියේ සඳහන් පරිදි භාරදීම සිදුකළ නොහැකි නම්, අධිකරණයෙන් තවදුරටත් වූ විධානයක් ලබා ගැනීමෙන් තොරව පරිශ්‍රයේ යම් ප්‍රකටව පෙනෙන ස්ථානයක නයිසයි තීන්දු ප්‍රකාශය අලවනු ලැබීමට සහ ඒ භාරදීම පිළිබඳව අධිකරණයට වාර්තා කිරීමට අධිකරණ නියෝග භාරදෙන නිලධරයාට බලය තිබිය යුතු ය. ඉහත කී ආකාරයට භාරදෙන ලද නයිසයි තීන්දු ප්‍රකාශය, විත්තිකරු වෙත යථා පරිදි පෞද්ගලිකව ම භාර දී ඇතැයි සලකනු ලැබිය යුතු ය.

නයිසයි තීන්දු ප්‍රකාශය රජයේ නිලධරයකු වෙත භාරදීම

**10.** (1) විත්තිකරු රජයේ නිලධරයකු වන අවස්ථාවක දී, අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි, නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවීමට අමතරව, නයිසයි තීන්දු ප්‍රකාශය පිටපත් දෙකකින්, විත්තිකරු සේවයේ නියුක්තව සිටින කාර්යාලයේ ප්‍රධානයා වෙත ද ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ "කාර්යාලයේ ප්‍රධානයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් ඒකකයක සාමාජිකයකු සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ විට, ඒ ඒකකයේ අණදෙන නිලධරයා අදහස් වේ;

(ආ) පළාත් සභාවක සේවයෙහි නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ විට, ඒ පළාත් සභාවේ ලේකම්වරයා අදහස් වේ;

(ඇ) පළාත් රාජ්‍ය සේවයේ සේවයෙහි නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ විට, ඒ තැනැත්තා සේවයෙහි නියුක්තව ඇත්තා වූ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා අදහස් වේ;

(ඈ) පළාත් පාලන ආයතනයක සේවයෙහි නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ විට, ඒ පළාත් පාලන ආයතනය මහ නගර සභාවක් නම්, ඒ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ද, ඒ පළාත් පාලන ආයතනය නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් නම්, ඒ නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා අදහස් වේ; සහ

(ඉ) වෙනත් යම් රජයේ නිලධරයකු සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ විට, ඒ තැනැත්තා සේවයෙහි නියුක්ත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා අදහස් වේ.

**11.** (1) විත්තිකරු විසින් නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙනී සිටීමට සහ දැක්වීමට හේතු ඇත්නම්, ඒ හේතු දැක්වීමට අවසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය යුතු දිනය ලෙස නයිසයි තීන්දු ප්‍රකාශයේ නිශ්චිතව දැක්විය යුතු දිනය, විත්තිකරු පදිංචි ස්ථානයේ සිට අධිකරණයට ඇති දුර සැලකිල්ලට ගෙන පහසුවෙන් නියම කරනු ලැබිය හැකි වඩාත් ම කලින් වූ දිනයක් විය යුතු ය. එවැනි යම් අවස්ථාවක දී, නිශ්චිතව දැක්විය යුතු එකී දිනය, නයිසයි තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට සති හයක් පසු නොවන දිනයක් විය යුතු ය.

විත්තිකරු විසින් පෙනී සිටීමට අවසරය ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට නයිසයි තීන්දු ප්‍රකාශයෙහි දැක්විය යුතු දිනය

(2) නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට අධිකරණය විසින් විත්තිකරුට යම් වැඩිදුර කාලයක් දෙනු නොලැබිය යුතු ය.

## III වන කොටස

## විත්තිකරු විසින් පෙනී සිටීම සහ හේතු දැක්වීම සඳහා ඉල්ලීමක් කිරීම

**12.** (1) මේ පනත යටතේ පවරන ලද නඩුවක දී, පෙනී සිටීමට සහ හේතු දැක්වීමට, නයිසයි තීන්දු ප්‍රකාශය නිකුත් කළ අධිකරණයෙන් ප්‍රථමයෙන් අවසරය ලබා ගෙන ඇත්නම් මිස, විත්තිකරු විසින් නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙනී සිටීම සහ හේතු දැක්වීම නොකළ යුතු ය.

අවසරය ලබා ගැනීමෙන් සහ ඇප තැබීමෙන් පසුව පමණක් විත්තිකරු විසින් පෙනී සිටීම සහ හේතු දැක්වීම කළ යුතු බව

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, විත්තිකරු විසින්, නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා ගැනීම සඳහා පෙත්සමක් මගින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය දිවුරුම් පත්‍රයක් මගින් සනාථ කරනු ලැබිය යුතු ය. තව ද, එම පෙත්සම සහ දිවුරුම් පත්‍රය නිශ්චිතව ම පැමිණිලිකරුගේ නඩු කටයුත්ත සම්බන්ධයෙන් විය යුතු අතර, එහි පැමිණිලිකරුගේ නඩුවට ඇති විත්තිවාචකය කුමක් ද යන්න සහ එය සනාථ කිරීම සඳහා විශ්වාසය තබන්නේ කුමන කරුණු මත ද යන්න පැහැදිලිව සහ සංක්ෂිප්තව සඳහන් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් පෙත්සම සහ දිවුරුම් පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසුව, පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා පැමිණිලිකරු විසින් ගොනු කරන ලද නඩුවට විරුද්ධව බැලූ බැල්මට පිළිගත හැකි විත්තිවාචකයක් එම පෙත්සමේ සහ දිවුරුම් පත්‍රයේ අන්තර්ගතයෙන් හෙළිදරව් වන බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම්, ඇපයක් තැබීමට යටත්ව, නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අධිකරණය විසින් විත්තිකරුට අවසරය ලබා දෙනු ලැබිය හැකි ය.

(4) පෙත්සමේ සහ දිවුරුම් පත්‍රයේ අන්තර්ගතයෙන් බැලූ බැල්මට පිළිගත හැකි විත්තිවාචකයක් හෙළිදරව් වන බවට අධිකරණය සෑහීමට පත් නොවන්නේ නම්, අධිකරණය විසින් (2) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම ප්‍රතික්ෂේප කොට, නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරනු ලැබිය යුතු ය.

විත්තිකරු විසින් ඇපයක් සැපයිය යුතු බව

**13.** අධිකරණය විසින් 12 වන වගන්තිය යටතේ පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දෙන අවස්ථාවක අධිකරණය විසින්-

(අ) නයිසයි තීන්දු ප්‍රකාශයෙන් අයැද ඇති සහ එහි නිශ්චිතව දක්වා ඇති, මුළු හිඟ බදු වාරික මුදල ලෙස පැමිණිලිකරුට ගෙවිය යුතු මුදලට;

(ආ) එවැනි යම් හිමිකම්පෑමක් ඉදිරිපත් කර ඇත්නම්, නයිසයි තීන්දු ප්‍රකාශයෙන් අයැද ඇති සහ එහි නිශ්චිතව දක්වා ඇති, පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දීමේ ආඥාවේ දිනය දක්වා සේවා ගාස්තු ලෙස පැමිණිලිකරුට ගෙවිය යුතු මුළු මුදලට; සහ

(ඇ) නයිසයි තීන්දු ප්‍රකාශයෙන් අයැද ඇති සහ එහි නිශ්චිතව දක්වා ඇති, බදු ගිවිසුම කල් පිරීමේ දිනයේ සිට හෝ බදු ගිවිසුම අවසන් කිරීම බලාත්මක වන දිනයේ සිට, පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දීමේ ආඥාවේ දිනය දක්වා සහ ඒ අවසරය ලබා දීමේ දිනයේ සිට එක් අවුරුද්දක වැඩිදුර කාලසීමාවක් සඳහා ප්‍රමාණ කළ අලාභ ලෙස පැමිණිලිකරුට ගෙවිය යුතු මුළු මුදලට,

නොඅඩු මුදලක ඇපයක් සපයන ලෙස විත්තිකරුට නියම කරනු ලැබිය යුතු ය.

සති දෙකක් ඇතුළත ඇපය තැන්පත් කළ යුතු බවට නියෝග කිරීම

**14.** (1) 13 වන වගන්තිය යටතේ අධිකරණය විසින් නියම කරන ලද ඇපය ඒ ආඥාව කරන ලද දින සිට සති දෙකක් ඇතුළත මුදලින් අධිකරණයේ තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ මුදල අධිකරණය විසින් පවත්වාගෙන යනු ලබන පොලී උපචය වන බැංකු ගිණුමක තැන්පත් කිරීම සඳහා තැන්පතු නෝට්ටුවක් නිකුත් කිරීමට කටයුතු සැලැස්විය යුතු අතර, අධිකරණය විසින් වැඩිදුර ආඥාවක් කරනු ලබන තෙක් එම මුදල් එම ගිණුමේ තබාගත යුතු ය.

(3) විත්තිකරු විසින්, (1) වන උපවගන්තියේ සඳහන් සති දෙකක කාලසීමාව ඇතුළත කරනු ලබන ඉල්ලීමක් මගින් ඔහුට එම ඇපය තැන්පත් කිරීමට නොහැකි බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි ප්‍රමාණවත් හේතු දැක්වීමෙන් තහවුරු කරනු ලබන්නේ නම් මිස, අධිකරණය විසින් නියම කරන ලද ඇපය තැන්පත් කිරීම සඳහා යම් වැඩිදුර කාලසීමාවක් අධිකරණය විසින් ලබා දෙනු නොලැබිය යුතු ය. එවැනි අවස්ථාවක දී, අධිකරණය විසින් කලින් ලබා දෙන ලද කාලසීමාව අවසානයේ සිට සති දෙකක් නොඉක්ම විය යුතු වැඩිදුර කාලසීමාවක් අධිකරණය විසින් ලබා දිය හැකි ය.

අධිකරණය විසින් නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත්කිරීම

**15.** විත්තිකරු-

(අ) 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නයිසයි තීන්දු ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ දී පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට අපොහොසත් වන අවස්ථාවක;

(ආ) පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමෙන් පසුව, පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා පැමිණිලිකරු විසින් ගොනු කරන ලද නඩු කටයුත්තට විරුද්ධව බැලූ බැල්මට පිළිගත හැකි විත්තිවාචකයක් හෙළිදරව් කිරීමට අපොහොසත් වී ඇති අවස්ථාවක; හෝ

(ඇ) 13 වන වගන්තිය යටතේ තැබීමට ආඥා කරන ලද ඇපය, 14 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත සැපයීමට අපොහොසත් වන අවස්ථාවක,

විත්තිකරුට යම් වැඩිදුර දැන්වීමක් කිරීමෙන් තොරව, අධිකරණය විසින් නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත්කරනු ලැබිය යුතු ය. එවැනි අවස්ථාවක දී, විනිශ්චයකාරවරයා විසින් නයිසයි තීන්දු ප්‍රකාශයෙහි "නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරන ලදී" යන වචන වලින් හෝ ඒ හා සමාන අර්ථය ඇති වචනවලින් පිටසනක් කර එම පිටසනට දිනය යොදා අත්සන් කරනු ලැබි යුතු ය:

එසේ වුව ද, නයිසයි තීන්දු ප්‍රකාශයක් වෙන් කළ හැකි කොටස්වලින් සමන්විත වේ නම්, කොටස් වශයෙන් නිදහස් කරනු ලැබිය හැකි අතර, කොටස් වශයෙන් නියත බවට පත්කරනු ලැබිය හැකි ය. තව ද, මෙහි පනවන ලද කිසිවක් මගින් නයිසයි තීන්දු ප්‍රකාශයේ ප්‍රතිඵලයක් ලෙස පැමිණිලිකරුගේ සහ විත්තිකරුගේ කැමැත්ත මත අධිකරණය විසින් යම් ආඥාවක් කිරීම වළක්වාලනු නොලැබිය යුතු ය.

ඉල්ලීමක් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් නයිසයි තීන්දු ප්‍රකාශයක් නියත බවට පත්කරනු ලැබූ ආඥාවට විරුද්ධව අභියාචනය කළ නොහැකි නමුත් එය ඉවතලනු ලැබිය හැකි බව

**16.** (1) විත්තිකරු විසින් 15 වන වගන්තියේ (අ) ඡේදය ප්‍රකාර ඉල්ලීමක් කිරීමට අපොහොසත් වීම හේතුකොට ගෙන නියත බවට පත් කර ඇති නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව විත්තිකරුවකු විසින් යම් අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි නමුත්, එම නියත තීන්දු ප්‍රකාශය ඇතුළත් කිරීමෙන් පසු එක් වසරක් නොඉක්මවන්නා වූ කාලසීමාවක් ඇතුළත-

(අ) එම නයිසයි තීන්දු ප්‍රකාශය ඔහු වෙත භාරදීමෙන් පසුව අනතුරක් හෝ අභාග්‍යයක් හෝ දේව ක්‍රියාවක් හේතුවෙන් විත්තිකරු අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමෙන් වළක්වනු ලැබීමේ; හෝ

(ආ) එම නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත භාර නොදීමේ,

හේතුව මත එම නියත තීන්දු ප්‍රකාශය ඉවත් කිරීම සඳහා විත්තිකරු විසින් ඊට විරුද්ධව පෙත්සමක් සහ දිවුරුම් පත්‍රයක් මගින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් පිළිගැනීමට අධිකරණයට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් හේතුවලට අමතරව, විත්තිකරු විසින්, නියත තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා ගැනීම සඳහා වන හේතු ද පෙත්සමෙන් සහ දිවුරුම් පත්‍රයෙන් අයැද සිටිය යුතු ය. එම පෙත්සම සහ දිවුරුම් පත්‍රය නිශ්චිතව ම පැමිණිලිකරුගේ නඩු කටයුත්ත සම්බන්ධයෙන් විය යුතු අතර, එහි පැමිණිලිකරුගේ නඩු කටයුත්තට ඇති විත්තිවාචකය කුමක් ද යන්න සහ එය සනාථ කිරීම සඳහා විශ්වාසය තබන්නේ කුමන කරුණු මත ද යන්න පැහැදිලිව සහ සංක්ෂිප්තව සඳහන් විය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්ති ප්‍රකාරව විත්තිකරු විසින් පෙත්සම සහ දිවුරුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබූ පසු, අධිකරණය විසින් පාර්ශ්වකරුවන්ට කරුණු කියා පෑම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් පසුව-

(අ) 15 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ඉල්ලීමක් කිරීමට විත්තිකරු අපොහොසත් වීම (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් නිසා සිදුව ඇති බවට; සහ

(ආ) විත්තිකරු විසින් බැලූ බැල්මට පිළිගත හැකි සාධක විත්තිවාචකයේ හෙළිදරව් කර ඇති බවට,

අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, 13 වන වගන්තිය යටතේ සැපයිය යුතු ඇපයට යටත්ව, අධිකරණය විසින්, නියත තීන්දු ප්‍රකාශය ඉවතලනු ලැබිය හැකි අතර, 14 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත එම ඇපය තැන්පත් කරනු ලැබුවහොත්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව එම කාරණය නිශ්චය කිරීමට කටයුතු කර ගෙන යනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් ඇපය එම කාර්යය සඳහා නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත සැපයීමට විත්තිකරු

අපොහොසත් වුවහොත්, එවිට, අධිකරණය විසින්, නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරමින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විධිවිධාන සලස්වා ඇති පරිදි අධිකරණය සෑහීමට පත් කිරීමට විත්තිකරු අපොහොසත් වූ අවස්ථාවක, අධිකරණය විසින්, ගාස්තු සහිතව විත්තිකරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභ කරනු ලැබිය යුතු ය.

IV වන කොටස

**පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දීමෙන් පසු කාර්ය පටිපාටිය**

පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දුන් විට අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය

**17.** (1) අධිකරණය විසින්-

(අ) 12 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විත්තිකරුට නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දී ඇත්තා වූ ද නියම කරන ලද ඇපය නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත තැන්පත් කර ඇත්තා වූ ද; හෝ

(ආ) නියත තීන්දු ප්‍රකාශය ඉවතලමින්, 16 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විත්තිකරුට පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දී ඇත්තා වූ ද, සැපයීමට නියම කරන ලද ඇපය නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත තැන්පත් කර ඇත්තා වූ ද, අවස්ථාවක,

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 384 වන, 385 වන, 386 වන සහ 387 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධිකරණය ඉදිරියේ පවත්වන නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 384 වන වගන්තියේ කාර්යය සඳහා, පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා ගැනීම සඳහා විත්තිකරු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම විත්තිකරුගේ විරෝධතාව ලෙස ද එම ඉල්ලීම සනාථ කරමින් විත්තිකරු විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් පත්‍රය විත්තිකරුගේ දිවුරුම් පත්‍රය ලෙස ද සලකනු ලැබිය යුතු ය.

(3) අධිකරණය විසින්, පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දුන් දින සිට එක් අවුරුද්දක් ඇතුළත නයිසයි තීන්දු ප්‍රකාශය නිදහස් කරමින් හෝ නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරමින් පැමිණිල්ලේ කාරණය සම්බන්ධයෙන් අවසාන ආඥාව ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(4) එසේ ප්‍රකාශ කරන ලද අවසාන ආඥාව, "නයිසයි තීන්දු ප්‍රකාශයෙන් නිදහස් කරන ලදී." හෝ "නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරන ලදී." යන වචනවලින් හෝ ඒ හා සමාන අර්ථය ඇති වචනවලින් නයිසයි තීන්දු ප්‍රකාශයෙහි පිටසන් කළ යුතු අතර, අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් එම පිටසනට දිනය යොදා අත්සන් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, නයිසයි තීන්දු ප්‍රකාශයක් වෙන් කළ හැකි කොටස්වලින් සමන්විත වේ නම්, කොටස් වශයෙන් නිදහස් කරනු ලැබිය හැකි අතර, කොටස් වශයෙන් නියත බවට පත් කරනු ලැබිය හැකි ය. තව ද, මෙහි පනවන ලද කිසිවක් මගින් නයිසයි තීන්දු ප්‍රකාශය පදනම් කරගෙන පැමිණිලිකරුගේ සහ විත්තිකරුගේ කැමැත්ත ඇතිව යම් ආඥාවක් කිරීම වළක්වාලනු නොලැබිය යුතු ය.

ඉදිරිපත් කරන ලද ලේඛනවල මුල් පිටපත් පරීක්ෂා කිරීම සඳහා ලබා දිය යුතු බව

**18.** මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී, පැමිණිල්ල සමඟ පිටපත් ඉදිරිපත් කරන ලද්දා වූ හෝ නඩුවට පදනම් කරගෙන ඇත්තා වූ බදු ගිවිසුමේ හෝ වෙනත් ලේඛනයක මුල් පිටපත ඒ නඩුව අධිකරණයේ දී සනාථ කරනු ලබන විට අධිකරණය විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. සිවිල් නඩු විධාන සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන් වුව ද, පරීක්ෂා කිරීමෙන් පසුව ඒ ගිවිසුම හෝ ලේඛනය පැමිණිලිකරු වෙත ආපසු භාර දිය යුතු ය.

වන්දි ප්‍රදානය කිරීම

**19.** (1) නයිසයි තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීමෙන් පසුව-

(අ) යම් වැදගත් කරුණු සිතාමතාම යටපත් කිරීමෙන් හෝ හෙළි නොකිරීමෙන් එම නයිසයි තීන්දු ප්‍රකාශය ලබාගෙන ඇති බව අධිකරණයට පෙනී යන අවස්ථාවක; සහ

(ආ) එම වැදගත් කරුණු සිතාමතාම යටපත් කිරීම හෝ හෙළි නොකිරීම හේතුවෙන් නයිසයි තීන්දු ප්‍රකාශය නිදහස් කර නඩුව නිෂ්ප්‍රභ කර ඇති අවස්ථාවක,

අධිකරණය විසින්, එම නඩුවේ දී ම, නයිසයි තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලැබුවේ යම් විත්තිකරුවකුට විරුද්ධව ද, එම විත්තිකරු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත, පැමිණිලිකරු විසින් වන්දි සහ ගාස්තු වශයෙන් ගෙවීම සඳහා ඒ විත්තිකරුට වැය වූ වියදම් හෝ සිදු වූ හානිය වෙනුවෙන් සාධාරණ යයි අධිකරණය විසින් සලකනු ලබන මුදලක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රදානයක්, මේ පනත යටතේ වන යම් තදනන්තර නඩු කටයුත්තක දී වන්දි ලබා ගැනීමේ නඩුවක් සඳහා බාධාවක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනත යටතේ පවරන ලද යම් නඩුවක් නිෂ්ප්‍රභ කර ඇතත් එය නොතකා, ඒ නඩුවේ දී සටහන් කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ වන්දි ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයකට එළඹෙන තුරු, එසේ නිෂ්ප්‍රභ කරන ලද නඩුව දිගටම පවත්නා ලෙස සලකනු ලැබිය යුතු ය.

විත්තිකරු විසින් පරිශ්‍රයේ සන්තකය ආපසු භාරදීම ආදිය

**20.** (1) නයිසයි තීන්දු ප්‍රකාශයට ප්‍රතිචාර වශයෙන් විත්තිකරු අධිකරණයේ පෙනී සිට පාර්ශ්වකරුවන් විසින් එකඟ විය හැකි නියම සහ කොන්දේසි මත අවස්ථාවෝචිත පරිදි, පරිශ්‍රයේ සන්තකය ආපසු භාරදීමට හෝ හිඟ බදු වාරික මුදල්, සේවා ගාස්තු සහ ප්‍රමාණ කළ අලාභ පියවීමට එකඟ වන අවස්ථාවක, අධිකරණය ඉදිරියෙහි ඒ පාර්ශ්වකරුවන් විසින් එකඟ වූ නියමවලට සහ කොන්දේසිවලට යටත්ව නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ පහතින් වූ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එකඟ වූ නියම සහ කොන්දේසි කිසිවක් කඩවන සේ විත්තිකරු කටයුතු කරනු නොලැබුවහොත්, (1) වන උපවගන්තියේ සඳහන් නියත තීන්දු ප්‍රකාශය, පාර්ශ්වකරුවන් අතර වූ එකඟතාවක් පරිදි, ක්‍රියාවේ යෙදවීමේ නඩු කටයුතු නතර කිරීමක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය. විත්තිකරු නියම සහ කොන්දේසි කඩවන සේ කටයුතු කරනු ලැබුවහොත් ඒ නියත තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කරවා ගැනීමට පැමිණිලිකරුට හිමිකම් තිබිය යුතු ය.

නයිසයි තීන්දු ප්‍රකාශයක් නිදහස් කිරීම හෝ නඩුවක් නිෂ්ප්‍රභ කිරීම යම් තදනන්තර නඩුවකට බාධාවක් නොවිය යුතු බව

**21.** මේ පනතේ විධිවිධාන යටතේ නයිසයි තීන්දු ප්‍රකාශයක් නිදහස් කිරීම හෝ නඩුවක් නිෂ්ප්‍රභ කිරීම, සිවිල් නඩු විධාන සංග්‍රහයේ හෝ වෙනත් යම් නීතියක අදාළ කාර්ය පටිපාටියක් යටතේ යම් උචිත නඩු නිමිත්තක් මත බදු දීමනාකරු විසින් හෝ පරිශ්‍රයේ සන්තකයට හිමිකම් ඇති වෙනත් යම් තැනැත්තකු විසින් ඒ පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා පවරනු ලබන වෙනත් යම් නඩුවකට බාධාවක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු ය.

V වන කොටස

**නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කිරීමෙන් පසු කාර්ය පටිපාටිය**

නියත තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් ලෙස සැලකිය යුතු බව

**22.** (1) මේ පනත යටතේ පවරන ලද නඩුවක දී ඇතුළත් කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශයක් නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරනු ලැබූ අවස්ථාවක දී, එය අධිකරණයේ ආඥාවකට යටත්ව, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 225 වන වගන්තියේ (3) වන උපවගන්තිය සහ 323 වන වගන්තිය ප්‍රකාරව පිස්කල් වෙත යථා පරිදි නිකුත් කරන ලද ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු ය. විත්තිකරු වෙත යම් වැඩිදුර දැන්වීමක් කිරීමෙන් තොරව, තීන්දු ප්‍රකාශය නියත කිරීමේ ආඥාව කරන ලද දින සිට දින දහහතරකට පසු එය ක්‍රියාවේ යෙදවිය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීම නතර නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාව, නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරන ලද දින සිට එක් අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ රිට් ආඥා ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති ආකාරයට එය ක්‍රියාවේ යෙදවීම පිස්කල්ගේ කාර්යය විය යුතු ය.

(4) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, විත්තිකරු විසින්, නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශයක් සම්බන්ධයෙන් අභියාචනයක් හෝ ප්‍රතිශෝධනය සඳහා වන ඉල්ලීමක් හෝ යථා තත්ත්වයට පැමිණවීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීම, ඒ නඩු කටයුත්ත නතර කරන

ලෙස අභියාචන අධිකරණය විසින් ප්‍රකාශිතව ම ආඥාවක් කරනු ලබන්නේ නම් මිස, ඒ නඩු කටයුත්ත නතර කිරීමට හේතුවක් නොවිය යුතු ය.

(5) විත්තිකරු විසින් කරන ලද අභියාචනයක් හෝ ඉල්ලීමක් ප්‍රකාරව ක්‍රියාවේ යෙදවීම නතර කරමින් ප්‍රකාශිතව ම ආඥාවක් කිරීමට පෙරාතුව, අභියාචන අධිකරණය විසින්, එම ප්‍රධාන අභියාචනය හෝ ඉල්ලීම නිෂ්ප්‍රභ කරනු ලැබුවහොත් ප්‍රමාණ කළ අලාභ ද ඇතුළුව 13 වන වගන්තිය යටතේ වන පැමිණිලිකරුගේ සම්පූර්ණ මුදල් හිමිකම් පෑම පියවීම සඳහා හෝ නඩුවේ සියලු අවස්ථානුගත කරුණු අනුව අභියාචන අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන ඉන් යම් කොටසක් පියවීම සඳහා මුදලින් ඇපයක් සැපයීමට විත්තිකරුට නියම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, පැමිණිලිකරුට හෝ ඔහුගේ ලියාපදිංචි නීතිඥවරයාට ප්‍රමාණවත් දැන්වීමක් කර ඇත්නම් මිස, එවැනි කිසිදු නතර කිරීමේ ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

විරෝධය පෑම අපහාස කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු බව

**23.** (1) 22 වන වගන්තියේ සඳහන් රිට් ආඥාව ක්‍රියාවේ යොදවන අතරතුර යම් තැනැත්තකු විසින් පිස්කල්ට විරෝධය පානු ලැබුවහොත් හෝ බාධා කරනු ලැබුවහොත් පිස්කල් විසින්, ඒ විරෝධය පෑමෙන් හෝ බාධා කිරීමෙන් පසු දින දහහතරක් ඇතුළත ඒ විරෝධය පෑම හෝ බාධා කිරීම පිළිබඳව අධිකරණය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. ඒ විරෝධය පෑමෙන් හෝ බාධා කිරීමෙන් අධිකරණයට සිදු කරන ලද අපහාස කිරීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කටයුතු නොකළ යුත්තේ මන්ද යන්නට හේතු දක්වන ලෙස නියම කරමින් ඒ විරෝධය පෑම හෝ බාධා කිරීම සිදු කළ තැනැත්තාට විරුද්ධව අධිකරණය විසින් දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත යටතේ රිට් ආඥාවක් ක්‍රියාවේ යොදවන අතරතුර පිස්කල්ට විරෝධය පාන හෝ බාධා කරන යම් තැනැත්තකු-

(i) එම විරෝධය පෑම හෝ බාධා කිරීම විනිශ්චිත ණයකරු නොවිය යුතු ඒ තැනැත්තා විසින්, යම් අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් ප්‍රකාරව තමා වෙනුවෙන් ම හෝ විනිශ්චිත ණයකරු නොවන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඔහු එම මුළු පරිශ්‍රයේ ම සන්තකය දරන බවට සද්භාවයෙන් හිමිකම් පෑම හේතුවෙන් සිදු වූයේ යයි අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් මිස; හෝ

(ii) ඒ හිමිකම් පෑම, යම් තැනැත්තකු විසින් යම් අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් ප්‍රකාරව, තමා වෙනුවෙන් ම හෝ විනිශ්චිත ණයකරු නොවන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඔහු එම මුළු පරිශ්‍රයේ ම සන්තකය දරන බවට හිමිකම් ප්‍රකාශ කරමින් සිදුකර ඇති බවට අධිකරණය විසින් සොයා දැනගනු ලැබ ඇත්නම් මිස,

ඒ තැනැත්තා අධිකරණයට අපහාස කිරීමේ වරද සිදු කරන්නේ ය.

(ආ) (අ) වන ඡේදය යටතේ අධිකරණයට අපහාස කිරීමේ වරද සිදු කරන යම් තැනැත්තකු රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ විධිවිධාන, (2) වන උපවගන්තිය යටතේ බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් නියම කරනු ලැබ ඇති වරදකරුවකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ තැනැත්තාට දඬුවම් නියම කිරීමට අමතරව, අධිකරණය විසින්, පැමිණිලිකාර විනිශ්චිත ණය හිමියා අදාළ පරිශ්‍රයේ නිරවුල් හා සාමකාමී සන්තකයේ පිහිටුවන ලෙසට පිස්කල් වෙත ආඥා කරනු ලැබිය යුතු ය.

නඩුව පැවරීමෙන් පසු විත්තිකරු විසින් පරිශ්‍රයේ සන්තකය හෝ යථා තත්ත්වය වෙනස් කිරීම

**24.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, නඩුවේ දී ඇතුළත් කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත හෝ ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයා වෙත භාර දෙනු ලැබීමෙන් පසු, ඒ විත්තිකරු හෝ ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයා විසින් කවර වූ හෝ ආකාරයකින් තුන්වන පාර්ශ්වයක් පරිශ්‍රය තුළ සන්තකයෙහි පිහිටුවනු නොලැබිය යුතු ය. එසේ කිරීම අධිකරණයට අපහාස කිරීමක් විය යුතු යː

එසේ වුව ද, නඩුව නිෂ්ප්‍රභ කරනු ලැබුවහොත් හෝ නයිසයි තීන්දු ප්‍රකාශය නිදහස් කරනු ලැබුවහොත්, මේ තහනම තවදුරටත් අදාළ නොවිය යුතු ය.

(2) නයිසයි තීන්දු ප්‍රකාශය භාර දෙන අවස්ථාවේ දී තිබූ තත්ත්වයෙන් ම පරිශ්‍රයේ යථා තත්ත්වය පවත්වාගෙන යාම විත්තිකරුගේ හෝ ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයාගේ කාර්යය විය යුතු අතර, විත්තිකරු හෝ ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයා විසින් අධිකරණයේ ආඥාවක් නොමැතිව පරිශ්‍රයේ යථා තත්ත්වය වෙනස් කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් පරිශ්‍රයක සන්තකය සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් තුන්වන පාර්ශ්වයකට ලබා දී ඇති අවස්ථාවක, ඒ අන්සතු කිරීම ශුන්‍ය සහ බල රහිත විය යුතු අතර, ඊට කිසිදු නීතිමය බලයක් හෝ එහි කිසිදු නීතිමය ප්‍රතිඵලයක් නොතිබිය යුතු ය. තව ද, ඒ තුන්වන පාර්ශ්වය තීන්දු ප්‍රකාශයේ පාර්ශ්වකරුවකු නොවූව ද, ඒ තුන්වන පාර්ශ්වය සහ ඔහු යටතේ පරිශ්‍රයේ සන්තකය දරන සියලු තැනැත්තන් තීන්දු ප්‍රකාශයෙන් බැඳී සිටින පාර්ශ්වකරුවකු මෙන් ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවෙන් පරිශ්‍රයෙන් ඉවත් කරනු ලැබීමට යටත් විය යුතු ය.

(4) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු වන යම් තැනැත්තකු රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(5) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ විධිවිධාන, (4) වන උපවගන්තිය යටතේ බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් නියම කරනු ලැබ ඇති වරදකරුවකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

## VI වන කොටස

### අභියාචනා

අධිකරණයේ ආඥාවකට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම

**25.** (1) (අ) 15 වන වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති හේතු මත විත්තිකරු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කොට නයිසයි තීන්දු ප්‍රකාශයක් නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරමින් කරන ලද ආඥාවක් මගින්;

(ආ) විත්තිකරු විසින් ඇපය තැබීමට අපොහොසත් වීම මත නයිසයි තීන්දු ප්‍රකාශයක් නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරමින් 16 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින්;

(ඇ) නියත තීන්දු ප්‍රකාශය ඉවත් කරවා ගැනීමට විත්තිකරු විසින් කරන ලද ඉල්ලීමක් නිෂ්ප්‍රභ කරමින් 16 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින්; හෝ

(ඇ) නයිසයි තීන්දු ප්‍රකාශය නිදහස් කරමින් හෝ නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරමින් 17 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද අවසාන ආඥාවක් මගින්,

අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 754 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් අභියාචනයක් ඉදිරිපත් කිරීම නොතකා, ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාව ක්‍රියාවේ යෙදවීම නතර කරනු නොලැබිය යුතු ය.

(3) නියත තීන්දු ප්‍රකාශයක් ඉවතලමින් අභියාචන අධිකරණය විසින් අභියාචනයක් පිළිගනු ලබන අවස්ථාවක දී සහ මේ පනතේ 22 වන වගන්තිය යටතේ රිට් ආඥාව දැනටමත් ක්‍රියාවේ යොදවනු ලැබ ඇති අවස්ථාවක දී, බදු ගිවිසුමේ වලංගු කාලසීමාව ඇතුළත අභියාචකට ස්වකීය රැකියාව හෝ ව්‍යාපාරය සඳහා පරිශ්‍රය අහිමි වීම වෙනුවෙන් අභියාචන අධිකරණය විසින් උචිත යයි සලකනු ලැබිය හැකි යම් මුදලක අලාභ ප්‍රදානය කරමින් අභියාචන අධිකරණය විසින් අභියාචකගේ වාසියට තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු ය. අභියාචකට පරිශ්‍රයේ නිරවුල් සන්තකය ආපසු භාර දීමට අභියාචන අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි ආඥා කළ හැකි ය:

එසේ වුව ද, අභියාචන අධිකරණයේ නඩු තීන්දුවේ දිනය වන විට බදු ගිවිසුම යටතේ අභියාචක වෙත පරිශ්‍රය ලබා දී ඇති බදු කාලසීමාව ඉකුත් වී ඇත්නම්, අභියාචකට සන්තකය ආපසු භාර දීමට අභියාචන අධිකරණය විසින් ආඥා නොකළ යුතු ය.

(4) නියත තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීමට අභියාචන අධිකරණය ආඥාවක් කරනු ලබන අවස්ථාවක දී, ඒ තීන්දු ප්‍රකාශය සිවිල් නඩු විධාන සංග්‍රහයේ 225 වන වගන්තියේ (3) වන උපවගන්තිය සහ 323 වන වගන්තිය ප්‍රකාරව පිස්කල් වෙත යථා පරිදි නිකුත් කරන ලද ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු ය. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත උචිත ඉල්ලීමක් කිරීම සඳහා නීතියෙන් අවසර දී ඇති කාලසීමාව ඉකුත් වන තෙක් එය ක්‍රියාවේ යෙදවීම නතර කරනු ලැබිය යුතු ය.

(5) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාවේ යෙදවීම නතර කරමින් ප්‍රකාශිත ආඥාවක් කරන්නේ නම් මිස, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කිරීම සඳහා නීතියෙන් අවසර දී ඇති කාලසීමාව ඉකුත් වීමෙන් පසුව රිට් ආඥාව ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

## VII වන කොටස

## විවිධ විධිවිධාන

අත් හැරුණු කරුණු

**26.** මේ පනතේ විධිවිධාන සලසා නොමැති කාර්ය පටිපාටිය පිළිබඳ යම් කාරණයක දී හෝ ප්‍රශ්නයක දී, ඒ හා සමාන කාරණයක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ දක්වා ඇති කාර්ය පටිපාටිය මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නේ නම්, අධිකරණය විසින් ඒ කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය.

ආකෘති පත්‍ර

**27.** මේ පනතේ කාර්ය සඳහා භාවිත කරනු ලැබිය යුතු යම් ආකෘති පත්‍රයක් මේ පනතේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක දී, ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි ඒ ආකෘති පත්‍රය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යොදවන අවස්ථාව වන විට අයවිය යුතු නො පියවූ උපයෝගීතා බිල්පත් හෝ සේවා ගාස්තු අයකර ගැනීම

**28.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ පවරන ලද නඩුවක දී, විත්තිකරු විසින්, පැමිණිල්ලේ දිනයේ සිට ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවේ දිනය දක්වා, සේවා ගාස්තු වශයෙන් හෝ එහි කොටසක් වශයෙන් හෝ යම් උපයෝගීතා බිල්පත් හෝ එහි කොටසක් වශයෙන් බදු ගිවිසුම යටතේ අය විය යුතු සහ ඔහු විසින් ගෙවිය යුතු යම් ගෙවීමක් පියවීම පැහැර හැර ඇත්නම්, ඒ අයවිය යුතු ගෙවීම් සහ ඒ අයවිය යුතු ගෙවීම් මත පනවන ලද පොලිය සහ දඩ මුදල් අයකර ගැනීම සඳහා, රිට් ආඥාව ක්‍රියාවේ යෙදවීමේ සහ පරිශ්‍රයේ නිරවුල් සන්තකය පැමිණිලිකරු වෙත භාර දීමේ දිනයේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත, පැමිණිලිකරු විසින් ඒ නොපියවීම සනාථ කිරීම සඳහා අදාළ වන ලේඛනගත සාක්ෂි මගින් තහවුරු කරනු ලබන පෙත්සමක් සහ දිවුරුම් පත්‍රයක් මගින්, එම නඩුවේ දී ම ඉල්ලීමක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පෙත්සමේ, දිවුරුම් පත්‍රයේ සහ ලේඛනගත සාක්ෂිවල අන්තර්ගත කරුණු පිළිබඳ සෑහීමට

පත්වීමෙන් පසුව, අධිකරණය විසින්, විත්තිකරුට පෙනී සිටින ලෙසට සහ ආඥාවේ නිශ්චිතව දක්වා ඇති මුදල පැමිණිලිකරුට ගෙවන ලෙසට අධිකරණය විසින් ආඥාවක් නොකළ යුත්තේ මන්ද යන්නට හේතු දක්වන ලෙස විධාන කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) නිසි විභාගයක් පැවැත්වීමෙන් පසුව, අධිකරණය විසින්, පරිශ්‍රයේ නිරවුල් සන්තකය පැමිණිලිකරු වෙත භාරදීමේ දිනය දක්වා වන උපයෝගීතා බිල්පත්වල සහ සේවා ගාස්තුවල යම් හිඟ මුදල්, ඒ බිල්පත් සහ සේවා ගාස්තු මත වන යම් පොලියක් හෝ දඩ මුදලක් ද සමඟ පැමිණිලිකරු වෙත ප්‍රදානය කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) සිවිල් නඩු විධාන සංග්‍රහයේ දක්වා ඇති මුදල් සඳහා වන තීන්දු ප්‍රකාශවලට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, ඒ ආඥාවෙන් ප්‍රදානය කරන ලද මුදල් අයකර ගැනීම සඳහා අදාළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවකට එරෙහිව අභියාචනයක් කිරීමට අදහස් කරන යම් විත්තිකරුවකු විසින්, එම අභියාචනයට පූර්ව කොන්දේසියක් වශයෙන්, ගෙවීමට නියම කරන ලද සම්පූර්ණ මුදල ඇපයක් වශයෙන් අධිකරණයේ තැන්පත් කරනු ලැබිය යුතු ය. තව ද, ඇපය වශයෙන් නියම කරන ලද සම්පූර්ණ මුදල තැන්පත් නොකර කරනු ලබන යම් අභියාචනයක් ප්‍රතික්ෂේප කිරීමට අධිකරණයට හිමිකම ඇත්තේ ය.

විශේෂ ලේඛනයක් සහ විශේෂිත විභාග ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතු බව

**29.** (1) මේ පනත යටතේ වූ නඩු පවරනු ලැබිය හැකි සෑම අධිකරණයක ම තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් විශේෂ ලේඛනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, එම නඩුවලට වෙනත් නඩුවලින් විශේෂිත වූ අංකයක් ලබා දෙනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ නඩු පවරනු ලැබිය හැකි සෑම අධිකරණයක ම, නයිසයි තීන්දු ප්‍රකාශයකට විරුද්ධව පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා දී ඇති නඩු පිළිබඳ විශේෂ විභාග ලැයිස්තුවක් තබා ගනු ලැබිය යුතු ය. ඒ අධිකරණයේ පටහැනි කවර රීතියක් හෝ පරිචයක් හෝ තිබුණ ද, එය නොතකා සහ නඩු විභාගයේ දිනය පිළිබඳ සාධාරණ දැන්වීමක් පාර්ශ්වකරුවන්ට ලබා දීමෙන් පසුව, ඒ නඩුවලට ඉක්මණින් සුදුස්සක් කිරීම සඳහා

පහසුකම් සැලැස්විය හැකි යම් දිනවල දී ඒ නඩු ඇසීමට තබන ලෙස නියම කිරීමට ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාට බලය තිබිය යුතු ය.

## VIII වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

වෙනත් නීති අදාළ වීම

**30.** බදු ගිවිසුම්වලට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන, මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට, මේ පනත මගින් පාලනය වන බදු ගිවිසුම්වලට අදාළ විය යුතු ය.

මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ලියා අත්සන් කරන ලද බදු ගිවිසුම්වලට මේ පනත අදාළ විය යුතු බව

**31.** (1) යම් බදු ගිවිසුමක් මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ලියා අත්සන් කර තිබීම නොතකා මේ පනතේ විධිවිධාන ඒ බදු ගිවිසුම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ඒ බදු ගිවිසුම මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව කල් පිරී ඇති හෝ අවසන් කර ඇති අවස්ථාවක දී, බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු සමඟ අලුත් බදු ගිවිසුමකට ඇතුළත්ව නොමැති නම් මිස, මේ පනත යටතේ පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා සහ හිඟ බදු වාරික මුදල්, සේවා ගාස්තු සහ ප්‍රමාණ කළ අලාභ අයකර ගැනීම සඳහා මේ පනත ආරම්භ වන දිනයේ සිට නඩු කටයුතු ආරම්භ කිරීමට බදු දීමනාකරුට හිමිකම තිබිය යුතු ය.

මේ පනත ආරම්භ වන දිනයේ දී කටයුතු අවසන් නොවී පවතින නඩු

**32.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් බදු දීමනාකරුවකු විසින්, පරිශ්‍රයක සන්තකය ආපසු ලබා ගැනීම සඳහා නඩුවක් පවරනු ලැබ ඇති සහ එම නඩුව මේ පනත ආරම්භ වන දිනයේ දී කටයුතු අවසන් නොවී පවතින අවස්ථාවක දී, එම පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සහ වෙනත් සහන ලබා ගැනීම සඳහා, මේ පනත ආරම්භ වීමෙන් පසුව මේ පනත යටතේ නඩුවක් පැවරීමට එම බදු දීමනාකරුට හිමිකම තිබිය යුතු ය.

වෙනත් ප්‍රතිකර්ම ආරක්ෂා කිරීම

**33.** මේ පනතේ විධිවිධාන, බදු ගිවිසුමක් යටතේ බද්දට දී ඇති පරිශ්‍රයක බදු දීමනාකරුවකුට එම පරිශ්‍රයේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හෝ එම බදු ගිවිසුම යටතේ බදු ගැනුම්කරුගෙන් අයවිය යුතු යම් මුදලක්, අලාභ, උපයෝගීතා බිල්පත් හෝ වෙනත්

ගෙවීම් අයකර ගැනීම සඳහා නීතියෙහි පවතින වෙනත් යම් ප්‍රතිකර්මයකට අමතරව විය යුතු අතර, ඒ විධිවිධානවලින් එම ප්‍රතිකර්ම හීන කිරීමක් සිදු නොවිය යුතු ය.

ගෙවල් කුලී පනත අදාළ නොවීම

**34.** (1) 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ ඇති කිසිවක් මේ පනත ආරම්භ වන දින හෝ එම දිනයෙන් පසුව ලියා අත්සන් කරනු ලබන බදු ගිවිසුමකට හෝ ඒ බදු ගිවිසුමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 29 වන වගන්තියේ අන්තර්ගත වන කිසිවක් මගින් යම් තැනැත්තකු මේ පනත යටතේ නඩුවක් පැවරීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

නීත්‍යනුකූල නියෝජිතයකු පාර්ශ්වකරුවකු කිරීමේ ප්‍රතිඵලය

**35.** සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXV වන පරිච්ඡේදය යටතේ යම් පාර්ශ්වකරුවකු වෙනුවට ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයා ලෙස යම් පත් කිරීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී, එසේ පත් කරනු ලබන තැනැත්තා නඩුවේ පාර්ශ්වකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය. මියගිය බදු ගැනුම්කරුවකු වෙත බද්දට දී ඇති පරිශ්‍රයක සන්තකය ආපසු ලබා ගැනීම සහ යම් වන්දි අයකර ගැනීම ඇතුළුව, මේ පනත යටතේ පවරන ලද නඩුවේ දී කරන ලද සෑම ආඥාවක් ම, නයිසයි තීන්දු ප්‍රකාශයක් ම හෝ නියත තීන්දු ප්‍රකාශයක් ම හෝ කරන ලද යම් දෙයක් ඒ ආදේශිත පාර්ශ්වකරුට එරෙහිව බලාත්මක කළ හැකි විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි

**36.** මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක දී-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු ම;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; සහ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකු ම,

ඒ වරද සිදු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ සංස්ථාගත මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු හෝ ඒ හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකු හෝ ඒ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයේ යම් පුද්ගලයකු විසින් ඒ වරද තමාගේ දැනුමකින් තොරව සිදු කරනු ලැබ ඇති බවට හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය සම්පූර්ණ නිසි උද්‍යෝගයෙන් තමා කටයුතු කළ බවට ඔප්පු කරන්නේ නම්, ඔහු ඒ වරද සිදු කරනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

නියෝග

**37.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනතේ ප්‍රතිපත්ති බලාත්මක කිරීමේ කාර්යය සඳහා, මේ පනත මගින් නියම කරනු ලැබීමට නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ නියෝග සාදනු ලැබීමට අවශ්‍ය වන්නා වූ හෝ බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) (අ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ නියෝගය යටතේ යථා පරිදි කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**38.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"අභියාචන අධිකරණය" යන්නෙන්, දිසා අධිකරණයේ ආඥා හෝ නඩු තීන්දු සම්බන්ධයෙන් සිවිල් අභියාචන, ප්‍රතිශෝධන හෝ යථා තත්ත්වයට පැමිණවීමේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් අධිකරණයක් අදහස් වේ;

"සිවිල් නඩු විධාන සංග්‍රහය" යන්නෙන්, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය අදහස් වේ;

"අධිකරණය" යන්නෙන්, අධිකරණ බලය ඇති දිසා අධිකරණය අදහස් වේ;

"බදු ගිවිසුම" යන්නෙන්, මුද්දර ගාස්තු යථා පරිදි ගෙවා ඇති, (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාරව යථා පරිදි ලියා අත්සන් කරන ලද, පරිශ්‍රයක බදු දීමනාකරුවකු සහ බදු ගැනුම්කරුවකු සම්බන්ධ වන යම් ගිවිසුමක් හෝ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ යථා පරිදි ලියා අත්සන් කරන ලද බදු සාධන පත්‍රයක් අදහස් වේ;

"නීත්‍යනුකූල පොලිය" යන්නෙන්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 192 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් තීරණය කර පළ කරනු ලබන අනුපාතිකය මත ගණනය කරනු ලබන පොලිය අදහස් වේ;

"බදු ගැනුම්කරු" යන්නෙන්, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ඉදිරිපිට දී යථා පරිදි ලියා අත්සන් කරන ලද, තත්කාලයේ බලපවත්නා සාධන පත්‍රයක් මගින් පරිශ්‍රයක සන්තකයේ හිමිකම අත්කර ගන්නා තැනැත්තකු අදහස් වන අතර, ඔහු මිය යාමෙන් පසුව ඔහුගේ උරුමකරුවකු, පොල්මංකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ නීත්‍යනුකූල නියෝජිතයකු ද ඊට ඇතුළත් වේ;

"බදු දීමනාකරු" යන්නෙන්, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ඉදිරිපිට දී යථා පරිදි ලියා අත්සන් කරන ලද, තත්කාලයේ බලපවත්නා සාධන පත්‍රයක් මගින් පරිශ්‍රයක සන්තකයේ හිමිකම පවරන තැනැත්තකු අදහස් වන අතර, ඔහු මිය යාමෙන් පසුව ඔහුගේ උරුමකරුවකු, පොල්මංකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ නීත්‍යනුකූල නියෝජිතයකු ද ඊට ඇතුළත් වේ;

"ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු" යන්නට, නඩුවෙහි විෂයය වස්තුව වූ පරිශ්‍රය භාරව සිටින විත්තිකරුගේ යම් අනුයෝජිතයකු ද ඇතුළත් වේ;

"සන්තකය" යන්නට, පරිශ්‍රයේ භෞතිකව පදිංචි වී සිටීම හෝ පරිශ්‍රයේ යතුරු රඳවා තබා ගැනීම ද ඇතුළත් වේ;

"පරිශ්‍රය" යන්නෙන්, යම් ගොඩනැගිල්ලකට හෝ ගොඩනැගිල්ලක කොටසකට සම්බන්ධ භූමිය සමඟ ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස අදහස් වන අතර, ගොඩනැගිල්ලක් නොමැති හිස් භූමියක් හෝ තට්ටු ගොඩනැගිල්ලක කොටසක් ද ඊට ඇතුළත් වේ;

"පෞද්ගලික අධිකරණ නියෝග භාරදෙන තැනැත්තා" යන්නෙන්, නීතිඥවරයකු විසින් හෝ යම් ආයතනයක් විසින් සේවයේ නියුක්ත කරන ලද්දා වූ සහ අධිකරණයේ පිස්කල් විසින් යම් ලිඛිත නීතියක් යටතේ පෞද්ගලික අධිකරණ නියෝග භාරදෙන තැනැත්තකු වශයෙන් ලියාපදිංචි කරන ලද්දා වූ තැනැත්තෙක් අදහස් වේ;

"අධිකරණ නියෝග භාරදෙන නිලධරයා" යන්නෙන්-

(අ) නයිසයි තීන්දු ප්‍රකාශය භාරදෙනු ලැබිය යුත්තේ යම් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සීමා ඇතුළත ද ඒ අධිකරණය විසින් පත් කරනු ලබන පිස්කල්;

(ආ) නයිසයි තීන්දු ප්‍රකාශය භාර දීම සඳහා අධිකරණය විසින් විශේෂ අවස්ථානුගත කරුණුවල දී විශේෂයෙන් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු;

(ඇ) ග්‍රාම නිලධාරිවරයා; හෝ

(ඈ) පෞද්ගලික අධිකරණ නියෝග භාරදෙන තැනැත්තකු,

අදහස් වේ;

"රජයේ නිලධරයා" යන යෙදුමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"සේවා ගාස්තුව" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ සහාධිපත්‍ය දේපළට අදාළව පිහිටුවන ලද කළමනාකරණ සංස්ථාවකට සහාධිපත්‍ය ඒකකයක අයිතිකරු විසින් ගෙවිය යුතු යම්

සේවා ගාස්තුවක් හෝ කළමනාකරණ ගාස්තුවක් හෝ එම දේපළ යම් කළමනාකරණ සමාගමක් හෝ සමිතියක් විසින් කළමනාකරණය කරනු ලබන යම් දේපළ සංකීර්ණයක් ඇතුළත පිහිටා ඇති අවස්ථාවක දී සහ බදු දීමනාකරු සහ බදු ගැනුම්කරු අතර වූ අදාළ ගිවිසුම යටතේ ඒ සේවා ගාස්තුව බදු ගැනුම්කරු විසින් ගෙවිය යුතු වන අවස්ථාවක දී, එම සමාගම හෝ සමිතිය වෙත දේපළෙහි අයිතිකරු විසින් ගෙවනු ලැබිය යුතු යම් සේවා ගාස්තුවක් හෝ කළමනාකරණ ගාස්තුවක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**39.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

[5 වන වගන්තිය]

නයිසයි තීන්දු ප්‍රකාශයේ ආකෘතිය

(ශීර්ෂය)

20.................... මස ..... වන දින (විනිශ්චයකාරවරයාගේ නම සහ ධුරය) ඉදිරිපිට මේ නඩුව සුදුස්සක් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබ, පැමිණිල්ල සහ ලේඛන කියවා බැලීමෙන් ද ............... වන දිනැති (පැමිණිලිකරුගේ නම) ගේ දිවුරුම් පත්‍රයේ අතුළත් සම්ප්‍රකාශ පිළිබඳව සෑහීමට පත්වීමෙන් ද පසු-

(අ) (විත්තිකරුගේ නම), ඔහුගේ සේවකයන්, අනුයෝජිතයන් සහ ඔහු යටතේ මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති පරිශ්‍රයෙහි සන්තකය දරන සියලු ම තැනැත්තන් පරිශ්‍රයෙන් නෙරපා හරින ලෙසට ද;

(ආ) (i) (අදාළ වේ නම්) පෙත්සමෙහි ඉල්ලන ලද හිඟ බදු වාරික මුදල වන රු. ................. ක මුදල ඉහත නම් සඳහන් විත්තිකරු විසින් ඉහත නම් සඳහන් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට ද;

(ii) (අදාළ වේ නම්) ................. දින දක්වා ගෙවිය යුතු හිඟ සේවා ගාස්තුව වන රු.................. ක මුදල ද....................... වන දින සිට මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති පරිශ්‍රයෙහි නිරවුල් සන්තකය ඉහත නම් සඳහන් පැමිණිලිකරු වෙත ආපසු ලබා දෙන තෙක් එක් මාසයකට රු. ................... ක අනුපාතිකයක වැඩිදුර සේවා ගාස්තුවක් ද ඉහත නම් සඳහන් විත්තිකරු විසින් ඉහත නම් සඳහන් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට ද;

(iii) (අදාළ වේ නම්)......................... වන දින සිට මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති පරිශ්‍රයෙහි නිරවුල් හා සාමකාමී සන්තකය ඉහත නම් සඳහන් පැමිණිලිකරු වෙත ආපසු ලබා දෙන තෙක් මාසයකට/ කාර්තුවකට/ අවුරුද්දකට රු.......................... ක අනුපාතිකයක ප්‍රමාණ කළ අලාභ වශයෙන් රු. .......................... ක මුදලක් ඉහත නම් සඳහන් විත්තිකරු විසින් ඉහත නම් සඳහන් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට ද;

සහ එම මුදල් මත .......................... වන දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් නීත්‍යානුකූල අනුපාතිකය අනුව පොලිය,නඩු ගාස්තු ද සමඟ ගෙවිය යුතු බවට ද ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති පරිශ්‍රය වෙත ඇතුළු වීමට සහ එහි සන්තකය ලබා ගැනීමට ද, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති පරිශ්‍රයෙන් ඉහත නම් සඳහන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, අනුයෝජිතයන් සහ ඔහු යටතේ සන්තකය දරන සියලු ම තැනැත්තන් නෙරපා හැරීමට ද, නිරවුල් සන්තකය පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට භාරදීමට ද, ඉහත නම් සඳහන් විත්තිකරුගේ නිවාස, ඉඩම්, භාණ්ඩ, ණය සහ බැර කිරීම් තහනමට ගෙන අවශ්‍ය නම් ඒවා විකිණීමෙන් මේ අධිකරණයේ තීන්දු ප්‍රකාශය මගින් ඉහත නම් සඳහන් විත්තිකරුට විරුද්ධව ඉහත නම් සඳහන් පැමිණිලිකරුට අයකර ගැනීමට ඇති ඉහත සඳහන් කරන ලද මුදල් අයකර ගැනීමට ද, මේ නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කිරීමෙන් පසු දින .......................... ක් ඇතුළත ඒ මුදල මේ අධිකරණය ඉදිරියට ගෙනෙන ලෙසට ද .......................... පළාතේ පිස්කල් විසින් ඒ ඒ දේපළ විකුණනු ලැබුවේ යම් මුදලකට හෝ මුදල්වලට ද, ඒ මුදල හෝ මුදල් සහ ඒ ඒ දේපළ විකුණනු ලැබුවේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් පිළිබඳව පිළිවෙළින් මේ අධිකරණයට දන්වන ලෙසට ද .......................... පළාතේ පිස්කල්ට මෙයින් අණ කරනු ලබන අතර, මේ නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කළ විට එය එම කාර්යය සඳහා අණ පත්‍රයක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

තව ද, ඉහත නම් සඳහන් විත්තිකරු 20.......................... මස .......................... වන දින .......................... (වේලාව) මේ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටිය යුතු බවටත්, මේ නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් නොකිරීමට හේතු කිසිවක් ඇත්නම් පෙනී සිටීමට සහ ඒ හේතු දැක්වීමට අවසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරන ලෙසට ද මෙයින් නියම කරනු ලැබේ. පෙනී සිටීමට සහ හේතු දැක්වීමට එසේ අවසරය දෙනු ලබන අවස්ථාවක සහ අධිකරණය විසින් නිශ්චය කරනු ලබන පරිදි ප්‍රමාණවත් ඇපයක් තැන්පත් කරනු ලබන අවස්ථාවක, ඉහත කී විත්තිකරුට අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට සහ නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව හේතු දැක්වීමට අවසර ලැබෙන්නේ ය. එසේ වුවද, ඉල්ලීමක් ඉදිරිපත් නොකරන්නේ නම් හෝ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ පෙනී සිටීමට සහ හේතු දැක්වීමට අවසරය ලබා නොදෙන අවස්ථාවක, සඳහන් කරනු ලැබිය යුතු හේතු මත එකී විත්තිකරුට විරුද්ධව නයිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් කරනු ලැබිය යුතු ය.

<u>ඉහත සඳහන් පරිශ්‍රය පිළිබඳ උපලේඛනය</u>

(අත්සන් කළේ) .............................
(විනිශ්චයකාරවරයාගේ නම හා ධුරය)

20................................ මස ........................ වන දින දී ය.

## දෙවන උපලේඛනය

[9(2) සහ 9(5) වන වගන්ති]

නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීම සඳහා අධිකරණ නියෝග භාරදෙන නිලධරයා/ පිස්කල්/ ග්‍රාම නිලධාරි/ පෞද්ගලික අධිකරණ නියෝග භාරදෙන තැනැත්තා වෙත යවන අණපත්‍රයේ ආකෘතිය

(ශීර්ෂය)

.................... අධිකරණයේ .................... පළාතේ

පිස්කල්/ග්‍රාම නිලධාරි,

පෞද්ගලික අධිකරණ නියෝග භාරදෙන තැනැත්තා වෙත ය.

දෙවන පිටපත් සහිතව, මේ සමඟ ඔබ වෙත එවනු ලබන ඉහත සඳහන් නඩුවේ නයිසයි තීන්දු ප්‍රකාශය එහි නියම කොට ඇති එක් එක් තැනැත්තාට නොපමාව භාර දී නයිසයි තීන්දු ප්‍රකාශයේ දෙවන පිටපතක් හා පැමිණිල්ලේ පිටපත්වලින් එකක් ඒ එක් එක් තැනැත්තා වෙත තබන්න. නැතහොත් ඔහුට දෙන්න.

නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරුට හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුට භාරදීමේ දී, තීන්දු ප්‍රකාශය භාරදුන් බවට පිළිගැනීමක් වශයෙන් අණපත්‍රයේ මුල් පිටපතෙහි එම විත්තිකරුගේ හෝ ඒ තැනැත්තාගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ හෝ ඒ දෙකම ලබා ගැනීමට උත්සාහ දැරීම ඔබේ කාර්යය වන්නේ ය.

ඔබ විසින් නිසි උද්‍යෝගය ක්‍රියාත්මක කිරීමෙන් නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීමට නොහැකි වුවහොත් අධිකරණයෙන් යම් වැඩිදුර විධානයක් ලබාගැනීමෙන් තොරව පැමිණිල්ලේ උපලේඛනයෙහි විස්තර කර ඇති නඩුවේ විෂය වස්තුව වන පරිශ්‍රයේ යම් ප්‍රකටව පෙනෙන ස්ථානයක නයිසයි තීන්දු ප්‍රකාශය ඇලවීමට ඔබට මෙයින් බලය දෙනු ලබන අතර, එවැනි සෑම අවස්ථාවක දී ම නයිසයි තීන්දු ප්‍රකාශය නඩුවට විෂයය වී ඇති පරිශ්‍රයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීමෙන් ඔබ එය භාරදුන් බව ඔබ විසින් අධිකරණයට වාර්තා කළ යුතු ය.

නයිසයි තීන්දු ප්‍රකාශය භාරදුන් ආකාරය පිළිබඳව, නයිසයි තීන්දු ප්‍රකාශය භාරදෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා පිළිබඳව, භාරදෙන ලද ස්ථානය පිළිබඳව, නයිසයි තීන්දු ප්‍රකාශය භාරදුන් තැනැත්තාගේ අනන්‍යතාවට අදාළ වෙනත් විස්තර සහ නයිසයි තීන්දු ප්‍රකාශය භාරදුන් දිනය සහ වේලාව ද සවිස්තරව දැක්වෙන වාර්තාවක් මගින් මෙහි සඳහන් දින සිට දින දහය (10)ක් ඇතුළත මේ අධිකරණය වෙත සහතික කිරීමට ඔබට මෙයින් විධාන කරනු ලබන අතර, ඒ වාර්තාවෙහි එම තීන්දු ප්‍රකාශය භාරදෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා විසින් අණපත්‍රයේ මුල් පිටපතෙහි සිය අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ හෝ ඒ දෙකම තැබුවේ ද යන්න හෝ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ හෝ ඒ දෙකම තැබීම ප්‍රතික්ෂේප කළේ ද යන්න සඳහන් කරන ලෙස ද හා ප්‍රදර්ශකයක් වශයෙන් අණපත්‍රයේ මුල් පිටපත ඔබේ සහතිකයට අමුණන ලෙසට ද ඔබට මෙයින් විධාන කරනු ලැබේ.

අධිකරණයේ අණ පරිදි,

(අත්සන් කළේ) ...........................
රෙජිස්ට්‍රාර්
.................. දිසා අධිකරණය

20.............................. මස .......... වන දින දී ය.

**තුන්වන උපලේඛනය**

[29 වන වගන්තිය]

ලේඛනයේ ආකෘතිය

| නඩුවේ අංකය | පැමිණිලිකරුගේ නම | විත්තිකරුගේ නම | නඩුවට විෂයය වී ඇති පරිශ්‍රය | නයිසයි තීන්දු ප්‍රකාශයේ දිනය | නියත තීන්දු ප්‍රකාශයේ දිනය/ නිදහස් කිරීමේ දිනය | තීන්දු ප්‍රකාශය ඉටු කරන ලද දිනය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |